**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 4**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 6.2.1. ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ නිර්මාණ අගයමු(II) |

**ඉගෙනුම් අත්වැල**

## පර්වත මස්තකයේ දේව මෑණියෝ ( Vergin of the rocks)



- ලියනාඩෝ ඩාවින්චි විසින් මෙම සිතුවම 1483 – 1500 කාලය තුළ නිර්මාණය කර ඇත.
- මරියතුමිය අසලින් සිටින ජේසු බිළිදා , සාන්ත ජෝන් බැප්ටිස් සහ සුරදූතියක් මෙම සිතුවමෙන් දක්වා ඇත.
- ත්‍රිකෝණාකාර ආකෘතියක් මත රූප සම්පිණ්ඩනය කර ඇත.
- කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
- දේව මෑණියන්ගේ මුහුණෙන් දැක්වෙන කරුණාවන්ත බව , දරුවන්ගේ මොළකැටි බව මෙන්ම හැඟීම් ප්‍රකාශනය සාර්ථක ලෙස දක්වා ඇත.
- විවිධ හැඩවලින් යුක්ත ගල්කුළු සහ පැළෑටි සහිතව පර්යාවලෝක ලක්ෂණවලින් යුක්ත ඈතට විහිදී ගිය භූමි දර්ශනයක් පසුබිමේ දක්වා ඇත.
- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කිරීම පිළිබඳව ශිල්පියා සතුව තිබූ පරිණත බව මෙයින් නිරූපිතය .
- මෙම වර්ණ ගැන්වීමේ සිද්ධාන්තය කියුරොස්කුරෝ(Chiaroscuro) ලෙස හැඳින්වේ.
- දුඹුරු වර්ණයයේ විවිධ ප්‍රභේද සහිත අඳුරු වර්ණ මාලාවක් යොදාගෙන ඇත .
- මරියතුමියගෙ හා ළදරුවන් ගේ මුහුණු වඩාත් ආලෝකමත් ව දක්වා ඇත.

## අවසන් භෝජන සංග්‍රහය(The Last Supper)

- ලියනාඩෝ ඩාවින්චි මිලානෝ ලුඩෝවිකෝ ඉල්මෝරෝ ආදිපාදවරයා යටතේ සේවය කරන කාලයේ මෙම සිතුවම නිර්මාණය කර තිබේ .



- මෙය ඇඳ ඇත්තේ ශාන්ත මරියා ඩෙලාග්‍රේසි නමැති ඩොමිනිකානු තාපසාරාමයේ භෝජනාගාර බිත්තියක් මතයි.
- ෆ්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.
- අවකාශමය පර්යාවලෝකය චිත්‍රණය කර ඇත.
- සිතුවම් මැද ජේසුස් වහන්සේ දක්වා ඇති අතර දෙපස අනුගාමිකයන් දොළොස් දෙනෙකි.
- ජුදාස් නැමැති පවා දෙන්නාගෙ මුහුණෙහි ඇති කුතුහලය නිරූපණය කිරීම හැඟීම් ප්‍රකාශනය මැනවින් දැක්වීමට ගත් උත්සාහයකි.
- දුඹුරු වර්ණයේ විවිධ ප්‍රභේද සහිත අඳුරු වර්ණ මාලාවක් භාවිත කර ඇත.
- වර්ණ මගින් ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක ලක්ෂණ මැනවින් දක්වා ඇත.
- කියුරොස්කුරෝ (Chiaroscuro)වර්ණ ගැන්වීමේ සිද්ධාන්තය භාවිත කර ඇත.
- මැද සිටින ජේසුස් වහන්සේ වඩාත් ආලෝකමත්ව මතුකර මතු කර සෙසු රූප අඳුරු අඳුර ලෙස වර්ණ ගන්වා ඇත .

**ක්‍රියාකාරකම**

1. **පර්වත මස්තකයේ දේව මෑණියෝ සහ අවසන් භෝජන සංග්‍රහය නම් වූ කලා නිර්මාණ පිළිබඳ පහත කරුණු ඇතුළත් වන සේ කෙටි සහ සරල විස්තරයක් කරන්න.(තේමාව,ශිල්ප ක්‍රමය , රූප භාවිතය, වර්ණ භාවිතය, තලය භාවිතය,හැඟීම් ප්‍රකාශනය, වර්තමානයේ දක්නට ලැබෙන ස්ථානය)**

**පැවරුම -ලියනාඩෝ ඩාවින්චිගේ වෙනත් සිතුවම් පිළිබඳ තොරතුරු සොයා බලන්න.**